# සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

**වැදගත්**

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස-කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## ලියා දැන්වන වග

### මිත්‍යාවට එරෙහිව තව දුරටත්

ශ්‍රී ලාංකික සමාජය ඉතා දරුණු ලෙස මිථ්‍යාවට යටවෙමින් තිබේය යන කාරණය අපි කලින් වතාවකද කතා කළෙමු. නැවත නැවතත් මේ කාරණය කතා කළ යුතු වන්නේ මේ යන ගමනේ කෙළවර පිළිබඳ අපට ඇතිවන බිය නිසාය.

මේ කාරණය පිළිබඳව වියත් ලේඛක ශ්‍යාමන් ජයසිංහ මහතා ලියූ සටහනක් පසුගියදා කියවන්නට ලැබුණි. ඔහු කියන පරිදි බොහෝ ආගම් වල අද සිටින්නේ අන්ධ අනුගාමිකයන්ය. ඇස් පනාපිට සාක්ෂි තිබියදීත් තමන්ගේ ආගමික නායකයන් කියන්නේ නම් ලෝකය පැතලි යයි පිළිගන්නට පවා ඔවුන් සූදානම් ය.

අනෙක් පසින් මිථ්‍යාවට විද්‍යාත්මක අර්ථකථන දෙන්නට උත්සාහ ගන්නා අයද සිටිති. විද්‍යාත්මක සංකල්ප එහෙ මෙහෙ කරමින් නූගත් මිනිසුන් රවටන්ට මොවුහු සමත්හුය.

බුදුන් වහන්සේ දේශනා කළේ අන්ධ ලෙස අනුගමනය කළ යුතු දහමක් නොවේ. බුද්ධියෙන් සිතා බලා තර්ක කර සත්‍යය පහදා ගත යුතු දර්ශනයකි. එහෙත් අද දස අත දකින්නට ඇත්තේ ඒ බුද්ධාගම නොවේ. අන්ධ ලෙස අදහන ආගමකි. ඒ ගැන ඉදිරිපත් කරන්නට උදාහරණ අපමණ ය. වඩාත්ම කණගාටුවට කාරණය වන්නේ බුද්ධිමත් ආගමික නායකයන් පවා මේ සත්‍යය නොදැක්කා සේ සිටීමය. සත්‍යය මේ යයි කියන්නට තරම් ශක්තියක් ඔවුනට නැත්තා සේ ය.

පුවත්පත් පිටු පුරා ලියැවෙන්නේ මිථ්‍යාවය. රූපවාහිනී අරක්ගෙන සිටින්නේ සාස්තරකාරයන්ය. වෙනෙකක් තබා රටේ ඉතා වැදගත් තීරණ පවා ගැනෙන්නේ මේ සාස්තරකාරයන්ට ඇවැසි පරිදිය. මිථ්‍යාව වැළඳගත් එක් නායකයෙක් පරාජය වෙද්දී අලුතෙන් පත්වන අයද අඩු වැඩි වශයෙන් මේ මිථ්‍යාවේම ගැලී සිටිති. රටේ ප්‍රධාන අමාත්‍යවරයෙක් සංවර්ධන වැඩ ආරම්භ නොකරන්නේ ඒ සඳහා සුදුසු නැකැත් නැති නිසා යයි කියන්නේ එනිසා ය. මේ ආකාරයට රටක් ඉදිරියට යන්නේ කෙසේද?



# මිථ්‍යාමතික නිවාරණවලින් වැළකීම සහ ඒකාධිපති විසඳුම් පරාජය කිරීම

**තිසරණී ගුණසේකර**

**"අතීතයෙන් වර්තමානය උපන්නේ කෙසේදැ යි වටහා ගැනීම, වර්තමානය තේරුම් ගැනීමට සේම, බාගෙ විට අනාගතය පිළිබඳ යම් අදහසක් ඇති කර ගැනීමටත් අපට උපකාරී වන්නේය." එරික් හොබ්ස්බෝන් (ඉතිහාසය පිළිබඳව)**

අහස උසට සංවර්ධන අභිලාෂයන් ඇතත්, ශ්‍රී ලංකාව තමන්ගේ පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වැය කරන්නේ, අයවැයෙන් සියයට 1 ට අඩු ප්‍රතිශතයකි. මෑතකදී නිමාවට පත්වූ "ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සමාජයේ" 2016 සම්මන්ත්‍රණයේදී මේ විෂමතාව අවධාරණය කරන ලදි. එම සම්මන්ත්‍රණය අමතමින් මහාචාර්ය අජිත් ද අල්විස් අනතුරු ඇඟවීමක් කෙළේය "තීන්දු තීරණ ගැනීමේදී විද්‍යාව නොතකා හැරීම හරහා ශ්‍රී ලංකාව සිදු කරගන්නේ බරපතල පාඩුවකි" විද්‍යාව පිළිබඳ මේ විද්වත් සංවාදය ඇරැඹුණේ, ආගමික වතාවත් පිළිබඳ විනාඩි දෙකක වීඩියෝ දර්ශනයකිනි. එය, දේශපාලනීකරණය වූ ආගම සමග ඇති අපේ භයානක ප්‍රේම වෘතාන්තය සහ මිථ්‍යා විශ්වාස කරපින්නා ගැනීමට ඇති ලෝලය පිළිබඳ ඛේදනීය විගඩම සංකේතවත් කෙළේය.

බුදුරජාණන් වහන්සේ සාමඤ්ඤඵල සූත්‍රයේදී ජ්‍යොතිෂය සහ බලි තොවිල් වැනි දෑ හඳුන්වන ලද්දේ, "තිරශ්චීන කලාවන්" වශයෙනි. (එවැනි කලාවනී ලැයිස්තුවක් ඒ සූත්‍රයේ අන්තර්ගත වෙයි■ අත බලා ශාස්ත්‍ර කීම සහ පේන කීම, ග්‍රහයෝග බැලීම සහ සිහින පැහැදිළි කිරීම, රාජ්‍ය නිලධාරීන් සඳහා අනාවැකි කීම, යකුන් පලවා හැරීම සහ ශුභ නැකැත් බැලීම, ජීවිත කාලය පිළිබඳ අනාවැකි කීම සහ දේශපාලනික හෝ ස්වාභාවික සිදුවීම් පිළිබඳ අනාවැකි කීම හා හඳහන් බැලීම ආදිය ඒවාට ඇතුළත් ය). එහෙත් බුදුරජාණන් වහන්සේගේ පිවිතුරු දහම සුරැකී ඇතැයි කියන ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධයන් ජ්‍යොතිෂ අනාවැකිවලට සලකන්නේ, දේවවාදී ඇදහීම් සහිත මිනිසුන් තම තමන්ගේ දෙවියන් වහන්සේගේ හෝ අනාගත වක්තෘන්ගේ වචනවලට සලකන පූජණීයත්වයෙන්මයි.

විසි එක් වැනි සියවසේ දෙවැනි දශකයේදීත්, බැතිමත් සිංහල බෞද්ධයන් තමන්ගේ සාමාන්‍ය අවබෝධය පසෙක ලා, සාස්තරකාරයෙකුගේ, යකැදුරෙකුගේ හෝ තිරශ්චීන කලා අනුයන යමෙකුගේ නියෝග පිළිපැදීමෙන් ජීවිතක්ෂයට පත්වන අවස්ථා අපට අසන්ට ලැබේ. ඊට මෑතම උදාහරණය සැපයෙන්නේ පිටිසර ගමකින් නොව, නාගරීකරණය වූ පිළියන්දලිනි. හමේ රෝගයකට ප්‍රතිකාරයක් වශයෙන් යකැදුරෙකු දුන් කෂායක් පානය කිරීමෙන් මේ පුද්ගලයා මරණයට පත්විය. යකැදුරාව දැන් අත්අඩංගුවට ගෙන තිබේ. ඔහුව නීතිය ඉදිරියට පමුණුවා අධිකරණයක් ඉදිරියේ මෙය විභාගයට ගනිතැයි අපි සිතමු. එසේ වන විට එය, තම ජීවිතය සහ අනාගතය පිළිබඳ කාරණය තිරශ්චීන

8 වන පිටට